# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2012 අංක 16 දරන බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2012 අගෝස්තු මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 10.00 යි.

## 2012 අංක 16 දරන බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]

එල්.ඩී.—ඕ.(අයි.එන්.සී.) 33/2010.

### බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංවිධානයක්, එහි සාමාජිකයන් විසින් එකඟත්වය පළ කරන ලද රීති ප්‍රකාර එම සංවිධානයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාර්ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කරගෙන යාමේ කාරණය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එසේම, එකී සංවිධානය එය පිහිටුවා ගත් පරමාර්ථය හා අදාළ අරමුණු සහ කාරණා මීට පෙර සාර්ථකව ඉටු කරගෙන යන ලද අතර එය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2012 අංක 16 දරන බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඊට පසු, බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන) දැනට සාමාජිකයන් වූ බොහෝ තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ "බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මින්මතු "සංස්ථාව" නමින් හඳුන්වනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන්, ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පැවරීමට හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, සිය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය සංස්ථාගත කිරීම.

2—PL 005141 -2,590 (2010/08)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) කඩුගන්නාව, බලන, බැලුංගල බුද්ධ ප්‍රතිමාවක් නෙළීම සඳහා කටයුතු කිරීම සහ එය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළු ලෝකය පුරාම බෞද්ධ භක්තිකයන් අතර, ථෙරවාද බුද්ධාගමෙහි මූලධර්ම පැතිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඈ) බෞද්ධ භක්තිකයන් අතර, බෞද්ධ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ කටයුතු යෙදීම ;

(ඉ) දැවැන්ත ශෛලමය නෙළීම් කලාවෙහි නිරත බොදු භක්තියට අයත් කලාකරුවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ඔවුනට ආධාර කිරීම ;

(ඊ) බෞද්ධ භක්තිකයන් අතර බෞද්ධ මූලධර්ම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය.

4. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුව තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයකු, උප සභාපතිවරුන් දෙදෙනෙකු, මහ ලේකම්වරයකු, සහකාර ලේකම්වරයකු, සහ භාණ්ඩාගාරික ඇතුළු සාමාජිකයන් නම දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මගින් පාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මෙම පනත ආරම්භ වන්නා වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානයේ ධුර දැරුවා වූ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, සංස්ථාවේ රීති අනුව අලුත් කමිටුවක් පත් කරනු ලබන තෙක් එම සාමාජිකයන් විසින් ධුර දැරිය යුතු ය.

(3) සංවිධානයේ නිර්මාතෘ වන ගරු කඹුරුගමුවේ වජිර තෙර, සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

5. (1) මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත බලතල තිබිය යුත්තේ ය :— සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා ඇප ඇතිව හෝ නැතිව, මුදල් ණයට ගැනීම හෝ එකතු කිරීම :

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොසලකා කළමනාකරණ කමිටුව විසින් සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතය ලබාගත යුතු ය ;

(ආ) සංස්ථාවට අයත් අරමුදල්, කළමනාකරණ කමිටුව තීරණය කරනු ලබන ආකාරයෙන් පාවිච්චි කිරීම සහ ආයෝජනය කිරීම ;

(ඇ) කළමනාකරණ කමිටුව තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක හෝ බැංකු කීපයක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(ඈ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයින් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුනට සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය;

(ඉ) සමාන අරමුණු ඇති වෙනත් දේශීය හෝ විදේශීය ආයතන සමග සම්බන්ධීකරණය සහ සහයෝගිතාවයෙන් කටයුතු කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු කාර්යක්ෂම, යෝග්‍ය සහ නිසි ආකාරයෙන් කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි අනෙකුත් සියලු දේවල් කිරීම.

(2) සංස්ථාවේ ඉහත බලතල ක්‍රියාත්මක කිරීමේ දී, සංස්ථාව විසින් බුද්ධ ශාසන සහ ආගමික කටයුතු විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඒ සඳහා ලබා ගත යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින්, මෙහි පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති, සංස්ථාවේ මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින්, කලින්කල, සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය ඔවුන් විසින් ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය අත් හැර යාම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍යය ;

(ආ) ධුර දරන්නන් හැර, කමිටුවේ සාමාජිකයන් තෝරාපත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය සහ බලතල, කාර්ය සහ කර්තව්‍යය ;

(ඇ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකත්ව ගාස්තු සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම සහ සාමාජිකත්වයෙන් පහ කිරීම ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය ;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ සඳහා ගණපූරණය සහ එහි වැඩ කටයුතු කරගෙන යාම ; සහ

(ඊ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන පරිද්දෙන්, එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සිදුකළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් එහි රීතිවලට යටත් විය යුතු ය.

**7.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල් හෝ දීමනා වශයෙන් සංස්ථාව වෙනුවෙන් මීට පෙරාතුව හෝ පසුව ලැබුණු සහ ලැබෙන සියලු මුදල් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ කීපයක සංස්ථාවේ අරමුදලේ බැරට තැන්පත් කළ යුතු ය.

සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංවිධානයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතුව තිබූ සියලුම ණය මුදල්, ග්‍රාහක මුදල්, දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංවිධානය විසින් ගෙවියයුතු සහ ඊට අයවිය යුතු ණය.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවා යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

සාමාජිකයින්ගේ වගකීම් සීමා කිරීම.

11. (1) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ගිණුම්, කළමනාකරණ කමිටුව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා, ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ මුද්‍රාව, එහි සභාපති සහ කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ තවත් සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**13.** සංස්ථාව විසුරුවා හරිනු ලබන්නේ නම් සහ එවිට, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, එහි රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එවැනි ආයතන සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ හෝ ඊට පෙර කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.